

Meeting with the delegation from World Learning under the Professional Fellows Programme (PFP) - 2025 July 07



A delegation from the Justin Divenanzo(Acting Mission Director, USAID), Maureen Hsia (Senior Development Advisor, U.S. Department of State), Angelina Hermon(Deputy Director, Office of Governance and Vulnerable Populations, USAID) met the A.M Faaiz (Member Election Commission), Prof. D.M.S.S. Lakshman Dissanayake (Member Election Commission) and the Saman Sri Ratnayake (Commissioner General of Election - 2025.06.26



ආදිවාසී ප්‍රජාවට මැතිවරණ කොමිෂන් සභාවේ ඊ සේවා භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීම 2025.07.01 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රඹකැන්ඔය කොට්ඨාස කළමණාකරණ මධ්‍යස්ථානයේ දී පැවැත්වීම සිදු කරන ලදි.




මැතිවරණ කොමිෂන් සභාවේ 2026-2029 සහභාගිත්ව උපාය මාර්ග සැලැස්ම සඳහා පාර්ශ්වකාර කණ්ඩායම් වූ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙතින් අදහස් හා යෝජනා ලබා ගැනීමේ සාකච්ඡාව 2025.06.23




මැතිවරණ කොමිෂන් සභාවේ 2026-2029 සහභාගිත්ව උපාය මාර්ග සැලැස්ම සඳහා පාර්ශ්වකාර කණ්ඩායම් වූ කාන්තා කණ්ඩායම් වෙතින් අදහස් හා යෝජනා ලබා ගැනීමේ සාකච්ඡාව 2025.06.25



ECSL Strategic Plan 2026 -2029 Review and Finalization Workshop





Commonwealth Election Professionals (CEP) Initiative Asia Region Training Event - Colombo 05 - 09 May 2025



මැතිවරණ කොමිෂන් සභාවේ 2026-2029 සහභාගිත්ව උපාය මාර්ග සැලැස්ම සඳහා පාර්ශ්වකාර කණ්ඩායම් වූ තරුණ කණ්ඩායම් වෙතින් අදහස් හා යෝජනා ලබා ගැනීමේ සාකච්ඡාව 2025.06.24


**උපදේශක මණ්ඩලය**
ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති
එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික
අමීර් ෆායිස් - සාමාජික
අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - සාමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

**සංස්කරණය**
චන්න පී. ද සිල්වා
(අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
**පරිගණක පිටු සැකසුම**
අමිල ගමගේ (මැතිවරණ කොමිෂන් සභාව)
**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය**
පර්යේෂණ හා සැලසුම් ශාඛාව,
මැතිවරණ කොමිෂන් සභාව

**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**
සංස්කාරක
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.



(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ. මෙහි ඇතුළත් කරුණු, උපුටා පළ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.




# කතිරයේ බලය


මැතිවරණ කොමිෂන් සභාව
ISSN-2706-0047
2025 මැයි- අගෝස්තු 9 වන වෙළුම 2 වන කලාපය





## ලෝකයේ හොඳම මැතිවරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තු අධ්‍යයන සඳහා වූ අන්තර්ජාතික ආයතනය (ICPS) සහ බොට්ස්වානා ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව එක්ව සංවිධානය කරන ලද 2025 ඔක්තෝබර් මස 03 වන දින පැවති එහි 21 වන අනතර්ජාතික සම්මන්ත්‍රණයේදී ලෝකයේ සියලු මැතිවරණ කළමනාකරණ ආයතන අතරින්,

- යහපත් පුරවැසියන්ගෙන් සමන්විත ප්‍රජාවක් නිර්මාණය කිරීම;
- මැතිවරණ ක්ෂේත්‍රයේ භාවිතාවන් නිවැරදිව හඳුනා ගැනීම;
- සාක්ෂි මත පදනම් වූ පර්යේෂණ හා ප්‍රතිපත්ති එළිදැක්වීම;

යන කරුණු මූලිකව පදනම් කර ගත් විශේෂ සමීක්ෂණයක ප්‍රතිඵල මත ලෝකයේ හොඳම මැතිවරණ කොමිෂන් සභාව ලෙස ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සම්මානයට පාත්‍ර වී ඇත.

මෙම සුවිශේෂී ජයග්‍රහණයේ වෙනුවෙන් සම්මානය ලබා ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා සහභාගී වූ අවස්ථාව.




## මැතිවරණ කොමිෂන් සභාවේ EC - EDR APP ජාතික සම්මානයෙන් පිදුම් ලබයි.




27 වන ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාණ උළෙලේ දී (NBQSA) 2025 රාජ්‍ය අංශයේ සහ රජයේ පුරවැසි සේවා කාණ්ඩය සඳහා පිරිනමන ලද රිදී සම්මානය මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙන ලද "EC -EDR / මම මැතිවරණ නිරීක්ෂකයෙක්" තොරතුරු තාක්ෂණ යෙදුම සඳහා පිරිනමන ලදී. එම සම්මානය ලබා ගැනීමේ සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්, සමන් ශ්‍රී රත්නායක මහතා, අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන), චින්තක කුලරත්න මහතා හා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) සංජීව ජයසිංහ මහතා ඇතුළු නිලධාරීන් සහභාගි වූ අවස්ථාව.

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

කේ.චතුරි දිල්හානී සේරසුන්දර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
මැතිවරණ කොමිෂන් සභාව



## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පාලනය සඳහා ගම්සභා ක්‍රමය ඇරඹෙන්නේ 1818දී තරම් ඈත කාලවකවානුවක දී ය. කාලානුරූපීව වෙනස් වූ මෙම පාලන ක්‍රමය 1980 දශකයේදී මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන ව්‍යුහ තුන යටතේ ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රධාන මැතිවරණ හතරෙන් වඩාත් සංකීර්ණ මැතිවරණ ක්‍රමය ලෙස පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රමය හැඳින්විය හැක. මිශ්‍ර සමානුපාතික ක්‍රමය යටතේ පැවැති මෙවර ඡන්ද විමසීම මෙරට 17 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමයි. වසර හතරකට වරක් පවත්වන මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2022 වසරේ දී පැවැත්වීමට නියමිතව තිබුණද ඒ වන විට මෙරට පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් කල් දමන ලදී. පසුව 2023 වසරේදී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නාම යෝජනා කැඳවනු ලැබුව ද, පැවති රජයෙන් මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය අරමුදල් ලබා නොදීම නිසා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම කල්දැමීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවිය. ඒ අනුව මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වනු ලැබුවේ වසර 7කට පසුවය.

2025 මැයි මස 6 වන දින පළාත් පාලන ආයතන 339 කට සභිකයන් 8287ක් පත් කර ගැනීමට සඳහා මෙම ඡන්ද විමසීම පැවැත් වූ අතර ඒ අතරට මහ නගර සභා 28ක්, නගර සභා 36, ප්‍රාදේශීය සභා 275ක් ඇතුළත් විය. ඒ අනුව, කල්මුණේ මහ නගර සභාව, සහ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන හැර සෙසු පළාත් පාලන ආයතන සඳහා මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් සභිකයන් පත්කර ගන්නා ලදි. මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයින් 75,589ක් තරග කරනු ලැබූ අතර ඒ සඳහා දේශපාලන පක්ෂ 49ක්, ස්වාධීන කණ්ඩායම් 244ක් ඇතුළත් විය. මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දය භාවිත කිරීමට සුදුසුකම් ලබා ඇති ඡන්ද දායකයින් සංඛ්‍යාව ඉකුත් මහ මැතිවරණයට සාපේක්ෂව ඉහළ ගොස් තිබේ. ඒ අනුව, මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දය භාවිත කිරීමට සුදුසුකම් ලැබූ ඡන්ද දායකයින් සංඛ්‍යාව 17,156,338කි

## 2. නාමයෝජනා භාරගැනීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) 26 වන වගන්තිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනෙයි මහ නගර සභාව හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව, කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව හා ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර දිවයිනේ සෙසු සියලුම පළාත් පාලන ආයතනවලට සභිකයන් තෝරා පත් කරගැනීමට අදාළ ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාර ගැනීමේ දැන්වීම 2025 මාර්තු මස 03 දින සිට අදාළ සියලුම පළාත් පාලන ආයතනවල ප්‍රසිද්ධ කරන ලදි. තවද එහිදී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් පළමු නාමයෝජනා පත්‍රයේ හා දෙවන නාමයෝජනා පත්‍රයේ නාමයෝජනා ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් ගණන, පළමු හා දෙවන නාමයෝජනා පත්‍රවලට ඇතුළත් විය යුතු අවම තරුණ හා කාන්තා අපේක්ෂිකයින් ගණන හා පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳ තොරතුරු අදාල නාමයෝජනා දැන්වීමේ මෙන්ම අංක 2425/70 දරන හා 2025.03.01 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ද පළ කරන ලදි.

මෙම පළාත් පාලන ආයතන 336 සඳහා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති/ උප සභාපති සහ සභිකයන් තෝරා පත් කරගැනීමේ ඡන්ද විමසීමට අදාළ ඇප මුදල් තැන්පත් භාර ගැනීම 2025 මාර්තු මස 03 දින සිට 19 දින මධ්‍යහ්න 12.00 දක්වා ද නාම යෝජනා භාර ගැනීම 2025 මාර්තු 17 දින සිට 2025 මාර්තු 19 දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා සහ 2025 මාර්තු 20 දින මධ්‍යහ්න 12.00 දක්වා ද ඒ ඒ තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කාර්යාලවල දී සිදු කරන ලදි. කෙසේ වෙතත් මේ අතරතුර 2025 මාර්තු මස 10 දින 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තියට යටත්ව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 26 වන වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව හා අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතනවලට සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා නාම යෝජනා දැන්වීම ප්‍රසිද්ධ කිරීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරන ලදි. ඒ අනුව එම ප්‍රාදේශීය සභාවලට අදාල නාම යෝජනා දැන්වීම නිකුත්කළ දින සිට නාමයෝජනා භාරගන්නා අවසන් දිනයට පෙර දින එනම්, 2025.03.26 දින මධ්‍යහ්න 12.00 දක්වා කාලසීමාව තුළ දී ඇප තැන්පත් මුදල් භාරගන්න ලද අතර 2025 මාර්තු මස 24 දින සිට මාර්තු 27 වන දින මධ්‍යහ්න 12.00 දක්වා නාම යෝජනා භාර ගන්නා ලදි.

කෙසේවෙතත් මෙම ඡන්ද විමසීමේ දී ඉතා ආන්දෝලනාත්මක ලෙස පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ඉතිහාසයේ නාමයෝජනා වැඩිම ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වූ ඡන්ද විමසීම ලෙස 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පත්විය. 2025 මාර්තු 20 වන දින මධ්‍යහ්න 12.00 වන විට පිළිගත් දේශපාලන පක්ෂ 49 කින් සහ ස්වාධීන කණ්ඩායම් 244 කින් නාම යෝජනා පත්‍ර 2527 කට ආසන්න සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබූ අතර එකී නාම යෝජනා පත්‍ර අතුරින් නාම යෝජනා පත්‍ර 427 ක් ප්‍රතික්ෂේප



හිම දෙවන මනාපය ලකුණු කර ඇත්තේ කරුණාපාල (C) ටය. එබැවින් එම ඡන්ද 8 කරුණාපාල (ක) ගේ ගොඩට එකතු වේ. ඒ අනුව අවසාන ගණනය A ට ඡන්ද 11 ක් සහ C ට ඡන්ද 18 ක් ලෙස සිදුවී කරුණාපාල (C) ජයග්‍රාහකයා වේ.

දැන් කිසියම් තාක්ෂණික හේතුවක් නිසා එම පළමු ඡන්ද විමසීම අවලංගු විය. නැවත ඊ ළඟ සතියේ එම ඡන්ද දායක පිරිසම සහ එම අපේක්ෂකයන්ම සහිතව නව ඡන්ද විමසීමක් පැවැත්විනි. පළමු ඡන්ද විමසීම අවලංගු වුවද ජයග්‍රාහකයා කරුණාපාල (C) වීමේ ප්‍රවනතාවය එහිදී හඳුනා ගන්නා ලදී. අමරපාලට (A) පළමු මනාපයද, කරුණාපාලට (C) දෙවන මනාපයද, බන්දුපාලට (B) තෙවන මනාපයද ලකුණු කර තිබූ ඡන්ද දායකයින් හතර දෙනා තම මතය වෙනස් කරමින් ජයග්‍රාහී විභවයක් සහිත කරුණාපාලට (C) පළමු මනාපයද, අමරපාලට (A) දෙවන මනාපයද, බන්දුපාල (B) තෙවන මනාපයද පල කරන ලදී. ඉතිරි ඡන්ද දායකයින් 25 දෙනා වෙනසක් නොවූ අතර පෙර පරිදිම මනාපය සලකුණු කරන ලදී. පහත දැක්වෙන්නේ එම ඡන්ද විමසීමේ සාරාංශයයි.

| ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව | 7 | 8 | 14 |
|---|---|---|---|
| පළමු මනාපය | A | B | C |
| දෙවන මනාපය | B | C | A |
| තෙවන මනාපය | C | A | B |

දෙවන ඡන්ද විමසීමේදී ඡන්ද පත්‍රිකා ලකුණු වී ඇති ආකාරය අනුව පළමු ඡන්ද විමසීමේ ජයග්‍රාහකයා වන කරුණාපාල (C) අරභයා ඒකාකාරභාවයට අදාල කොන්දේසි සැපිරී ඇති බව හොඳින්ම පෙනේ. එනම් දෙවන ඡන්ද විමසීමේදී වෙනසක් සිදුවී ඇති සෑම ඡන්ද පත්‍රිකාවකම, වෙනස සිදුව ඇත්තේ කරුණාපාලට වාසි වන ආකාරයටය.

දැන් නැවතත් 94 ව්‍යවස්ථාව අනුව ජයග්‍රාහකයා තෝරමු. කරුණාපාල (C) පළමු මනාප 14 ක් ලබා ගෙන ඇත. නමුත් එය 50% ට අඩු බැවින් දෙවන මනාප ගණනයකට යා යුතුය. මෙවරද බන්දුපාලගේ (B) පළමු මනාප සංඛ්‍යාව පෙර ගණන වන 8 මය. නමුත් අමරපාලට (A) පළමු මනාප 4 ක් අහිමි වී එය පෙර ගණනට වඩා අඩු වී 7 බවට පත් වී ඇත. දැන් තරගයෙන් ඉවත් වීමට සිදු වන්නේ අමරපාලටය. ඔහුට පළමු මනාපය ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකා 7 හි දෙවන මනාපය ලකුණු කර ඇත්තේ බන්දුපාලටය. ඒ අනුව දෙවන වටය ගණනය අවසානයේ බන්දුපාලගේ ඡන්ද සංඛ්‍යාව 15 ක් බවට පත්වේ. එහෙත් කරුණාපාලට ඇත්තේ 14 ක් පමණය. ජයග්‍රාහකයා බවට පත්වන්නේ බන්දුපාලය!

මේ අනුව අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රම වේදයට අනුව සාධාරණත්වයේ තෙවන නිර්ණායකය වන ඒකාකාරභාවයේ නිර්ණායකය කඩවිය හැකි අවස්ථා ඇතිවිය හැකි බව මෙයින් සනාථ වේ. ඉදිරි කලාපයේ ලිපිය මගින් සාධාරණත්වයේ හතර වන නිර්ණායකය පිළිබඳව විමසා බලමු.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. Excursions of Modern Mathematics - Peter Tannenbaum - 2009
2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

## 2024 ඡන්ද හිමි නාමලේඛනයට අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | | ඡන්ද හිමියන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 1,773,460 |
| 02 | ගම්පහ | 1,896,304 |
| 03 | කළුතර | 1,033,206 |
| 04 | මහනුවර | 1,202,558 |
| 05 | මාතලේ | 434,246 |
| 06 | නුවරඑළිය | 610,117 |
| 07 | ගාල්ල | 912,571 |
| 08 | මාතර | 693,549 |
| 09 | හම්බන්තොට | 526,599 |
| 10 | යාපනය | 600,527 |
| | යාපනය දිස්ත්‍රික්කය | 498,140 |
| | කිළිනොච්චි දිස්ත්‍රික්කය | 102,387 |
| 11 | වන්නි | 308,466 |
| | වවුනියාව දිස්ත්‍රික්කය | 129,293 |
| | මන්නාරම දිස්ත්‍රික්කය | 91,373 |
| | මුලතිව් දිස්ත්‍රික්කය | 87,800 |
| 12 | මඩකලපුව | 455,520 |
| 13 | දිගාමඩුල්ල | 562,445 |
| 14 | ත්‍රිකුණාමලය | 319,399 |
| 15 | කුරුණෑගල | 1,430,286 |
| 16 | පුත්තලම | 668,525 |
| 17 | අනුරාධපුරය | 750,101 |
| 18 | පොළොන්නරුව | 254,111 |
| 19 | බදුල්ල | 712,401 |
| 20 | මොණරාගල | 403,519 |
| 21 | රත්නපුර | 932,855 |
| 22 | කෑගල්ල | 715,565 |
| | එකතුව | 17,296,565 |

# ජනාධිපතිවරයා තේරීමේ විධික්‍රමය හා කෙනත් ඇරෝ ගේ අභව්‍ය ප්‍රමේයය

(4 වන කොටස)

ආචාර්ය ජයන්ත සේනාධීර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

අප විසින් ජනාධිපතිවරයා තේරීමේ විධික්‍රමය හා කෙනත් ඇරෝගේ අභව්‍ය ප්‍රමේයය යන තේමාව යටතේ සාකච්ඡාව ආරම්භ කලේ කතිරයේ බලය 2023- ඔක්තෝබර් - දෙසැම්බර් කලාපයෙනි එහි දෙවන කොටස 2024-ජනවාරි-අප්‍රේල් කලාපයේද, තෙවන කොටස 2024-මැයි-අගෝස්තු කලාපයේද පලවිය. මෙවර කලාපයේ පලවන්නේ එහි සිව් වන කොටසයි. මෙම සාකච්ඡාවේ අවිච්ඡින්න බව රැක ගැනීම සඳහා පළමු, දෙවන සහ තෙවන කොටස් වල සාකච්ඡා වූ කරුණුවල සාරාංශයක් ඉදිරිපත් කිරීම සුදුසු යැයි සිතේ.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඛෂඪ පරිච්ඡේදයේ 94 ව්‍යවස්ථාවේ ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා තෝරා ගන්නා ක්‍රමවේදය පිළිබඳව, විශේෂයෙන්ම ජනාධිපතිවරණයේදී බහුතරය, එනම් වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට පනහකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකුට ලබාගත නොහැකි වූ අවස්ථාවකදී, දෙවන හා තුන්වන මනාපය සැලකිල්ලට ගෙන ජනාධිපතිවරයා තෝරා ගන්නා ක්‍රමවේදය එහි දක්වා ඇත.

අපේක්ෂකයන් වෙනුවෙන් මනාප ලබා දීමක් ඇතිවිට (එනම් තරා කිරීමක් ඇතිවිට) සහ 50% කට වැඩියෙන් කිසිදු අපේක්ෂකයෙකුට පළමු මනාපය නොලැබුණු විට දී ජයග්‍රාහකයා තෝරා ගැනීමේ විවිධ ක්‍රම වේද පවතී. මේ සැම ක්‍රමයකම ප්‍රබලතා මෙන්ම දුබලතා ද පවතී. පසුගිය කලාපයකදී අප ඔබට හඳුන්වා දුන් සාධාරණත්වයේ මූලධර්ම සතර වන බහුතරයේ නිර්ණායකය, කොන්ඩොසෙට් නිර්ණායකය, ඒකාකාරභාවයේ නිර්ණායකය සහ අදාල නොවන විකල්පයන්ගෙන් ස්වායක්තභාවයේ නිර්ණායකය යන නිර්ණායක සතර අදාල ක්‍රමවේද විසින් කොතරම් ප්‍රමාණයකට තෘප්ත කරන්නේද යන්න සලකා බැලීම මෙම සාකච්ඡාවේ වැදගත් අරමුණකි.

පසුගිය ලිපි මගින්, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා තෝරන ක්‍රමවේදය මගින් බහුතරයේ නිර්ණායකය අනිවාර්යයෙන්ම තෘප්ත කරන අතර කොන්ඩොසෙට් නිර්ණායකය තෘප්ත නොකරන අවස්ථා පැවතිය හැකි බව පෙන්වාදෙන ලදී. අද අපි එම ක්‍රමවේදය විසින් ඒකාකාරභාවයේ නිර්ණායකය තෘප්ත නොකරන අවස්ථාවකට උදාහරණයක් ඉදිරිපත් කරමු.

ඒකාකාර භාවයේ නිර්ණායකය යනු කුමක්දැයි යලි සලකා බලමු. කිසියම් මැතිවරණයකදී ජයග්‍රාහකයා තේරීමේ නිශ්චිත ක්‍රියාපටිපාටියකට අනුව (එනම් ව්‍යවස්ථාවට අනුව) යම් අපේක්ෂකයකු ජයග්‍රාහකයා වූයේ යැයි සිතමු. දැන් නැවතත් එම ඡන්ද දායකයින්ටම, එම ඡන්ද අපේක්ෂකයින්ගෙන්ම කෙනෙකු තෝරා පත් කරගැනීම සඳහා එම තේරීමේ ක්‍රියාපටිපාටිය අනුවම නැවතත් ඡන්ද විමසීමක් සිදු කළේ නම් සහ තවදුරටත් එම අලුත් ඡන්ද විමසීමේදී, වෙනසක් සිදුවී ඇති සෑම ඡන්ද පත්‍රිකාවකම, වෙනස සිදුව ඇත්තේ පෙර ජයග්‍රාහකයාටම වාසි වන ආකාරයට මිස අන් අයුරකින් නොවේ නම්, මෙවරද අදාල ක්‍රියා පටිපාටියට අනුව ජයග්‍රාහකයා විය යුත්තේ පෙර ජයග්‍රාහකයාමය. මෙය ඒකාකාරභාවයේ නිර්ණායකයයි.

අපේ 94 ව්‍යවස්ථාවේ ක්‍රමවේදයට අනුව ඒකාකාරභාවයේ නිර්ණායකය තෘප්ත නොකරන අවස්ථා පැවතිය හැකි බව අප දැන් ඉදිරිපත් කරන උදාහරණයෙන් තහවුරු වේ.

ගම්මානයක, මූලිකත්වය දිය යුතු සංවර්ධන ව්‍යාපෘති තේරීමේ කමිටුවක සභාපතිවරයා තෝරා පත් කර ගැනීමට ඡන්ද විමසීමක් පැවැත්වේ. එම ඡන්ද විමසීම පැවැත්වෙන්නේත්, ජයග්‍රාහකයා තෝරන්නේත් 94 ව්‍යවස්ථාවේ ක්‍රම වේදයට අනුකූලවය. මෙම ඡන්ද විමසීමේදී අමරපාල (A), බන්දුපාල (B) සහ කරුණාපාල (C) යන අපේක්ෂකයන් තිදෙනා සභාපතිත්වයට ඉදිරිපත්වේ. ඡන්දය භාවිතා කිරීමට හිමිකම ඇති පිරිස 29 කි. ඡන්ද පත්‍රිකාවේ මනාප තුනක් දක්වා සටහන් කිරීමට අවස්ථාව සලසා ඇත. එම එක් එක් ඡන්ද පත්‍රිකා වල මනාප සටහන් කර තිබූ ආකාරය අනුව ඒවා පහත සඳහන් පරිදි හතර ආකාරයකට වර්ග කල හැක.

| **ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව** | 7 | 8 | 10 | 4 |
|---|---|---|---|---|
| **පළමු මනාපය** | A | B | C | A |
| **දෙවන මනාපය** | B | C | A | C |
| **තෙවන මනාපය** | C | A | B | B |

දැන් අපි 94 ව්‍යවස්ථාව අනුව මේ ඡන්ද විමසීමේ ජයග්‍රාහකයා කවුදැයි විමසා බලමු.

අමරපාල (A) පළමු මනාප 11ක් (7+4) ලබාගෙන ඇත. කරුණාපාල (C) පළමු මනාප 10 ක් ලබා ගෙන ඇත. බන්දුපාල (B) ලබා ගෙන ඇත්තේ පළමු මනාප 8 ක් පමණි. කිසිම අපේක්ෂකයකු වලංගු චන්ද සංඛ්‍යාවෙන් සියයට පනහට වැඩියෙන් එනම් 15 හෝ ඊට වැඩියෙන් ලබාගෙන නැත. එබැවින් දෙවන මනාප විශ්ලේෂණයට අනිවාර්යයෙන්ම යා යුතුය. ඒ අනුව පළමු මනාපයෙන් තුන් වැන්නා වූ බන්දුපාල (B) තරගයෙන් ඉවත් කෙරේ. ඔහුට පළමු මනාපය දුන් පත්‍රිකා 8



විය. එය සමස්ථ නාම යෝජනා ප්‍රමාණයෙන් 14% කි. එහිදී අදාළ නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ඉදිරිපත් කළ පෙත්සම් විභාග කිරීමෙන් අනතුරුව අභියාචනාධිකරණයේ විනිසුරු මොහොමඩ් ලෆාර් තාහීර් සහ ප්‍රියන්ත ප්‍රනාන්දුගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් විසින් උප්පැන්න සහතික පිටපත් සාම විනිසුරුවරුන් විසින් සහතික කරනු ලැබීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 07 වන උපලේඛනය යටතේ සිදු කළ දිවුරුම සම්බන්ධයෙන් ඇති වූ ගැටලු මත ප්‍රතික්ෂේප කෙරුණු නාම යෝජනා පත්‍ර යළි භාර ගන්නා ලෙස අප්‍රේල් 10 දින අදාළ කොට්ඨාසවල තේරීම් භාර නිලධාරීන්ට නියෝග කළේ ය. ඒ අනුව මෙම කරුණුවලට අදාළව ප්‍රතික්ෂේප කෙරුණු නාම යෝජනා පත්‍ර 35කට ආසන්න සංඛ්‍යාවක් යළි භාර ගැනීමට සිදුවිය.

## 3. තැපෑලෙන් ඡන්දය දීම

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී පළාත් පාලන ආයතන 336ක් වෙනුවෙන් 2025.03.03 දිනයේ දී ද කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව හා අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව යන ප්‍රාදේශීය සභා 03 සඳහා 2025.03.10 දිනයේ ද නාමයෝජනා දැන්වීම ප්‍රසිද්ධ කරන ලදි.

මෙවර පළාත් පාලන ආයතන 339 වෙනුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් 663,499 ක් ලැබී තිබූ අතර පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව 648,495 කි. පළාත් පාලන ආයතන 03 කින් සමන්විත කිළිනොච්චිය දිස්ත්‍රික්කයෙන්, අඩුම තැපැල් ඡන්ද හිමියන් සංඛ්‍යාව වු 3,792 ක් ද, වැඩිම තැපැල් ඡන්ද හිමියන් සංඛ්‍යාව වු 70,509 ක් පළාත් පාලන ආයතන 21 ක් පිහිටි කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත.

පළාත් පාලන ආයතන 339 වෙනුවෙන් තැපැල් ඡන්ද හිමියන් වෙත, තැපැල් ඡන්ද නිකුත් කිරීම 2025.04.07 දිනට නියමිතව තිබුණු අතර භාරදෙන ලද ඇතැම් නාමයෝජනා හා සබැඳි අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් පළාත් පාලන ආයතන 113 ක පමණක් තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු D කවර 2025.04.07 නිකුත් කරන ලදී. එසේම අධිකරණ තීන්දු අනුව තවත් පළාත් පාලන ආයතන 114 ක් සඳහා 2025.04.10 දින තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු D කවර නිකුත් කරන ලදී.


සහතික කිරිමේ නිලධාරින්ගේ කාර්යාලවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් දින 03 ක් වෙන් කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, මැතිවරණ මහලේකම් කාර්යාලය, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාසවල තැපැල් ඡන්ද සලකුණු කිරීම 2025.04.22 දිනයේ ද සෙසු සියලුම රජයේ කාර්යාල, සියලුම ආරක්ෂක හමුදා කඳවුරු, සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල හා සියලුම පාසැල්වල තැපැල් ඡන්දය සලකුණු කිරීම 2025.04.23 හා 24 දිනවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට හා එම දිනවල තැපැල් ඡන්දය සලකුණු කිරීමට නොහැකිවන තැපැල් ඡන්ද හිමියන් සඳහා 2025.04.28 හා 29 දිනවල දී ඒ ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට නියමිතව තිබුණි. එසේවුව ද, අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් තැපැල් ඡන්ද නිකුත් කිරීම ප්‍රමාද වීම මත තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින සංශෝධනය කිරීමට 2025.04.17 දින මැතිවරණ කොමිෂන් සභාව තිරණය කරන ලද අතර ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන හා හමුදා කඳවුරු, පොලිස් ස්ථාන, පාසැල්, ව්‍යවස්ථාපිත මණ්ඩලවල තැපැල් ඡන්ද සලකුණු කිරීම අදාළ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී 2025.05.24,25, 28 හා 29 දිනවල දී සිදු කරන ලදී.

මෙම කාල සීමාව අතරතුර පැවති මහනුවර වූ දළදා දැක්මේ විශේෂ රජකාරි සඳහා යොදවන ලද දසදහසකට (10,000) ආසන්න පොලිස් නිලධාරීන්ට මහනුවර දී අදාළ තැපැල් ඡන්දය සලකුණු කිරීමට පහසුකම් ලබා දෙන ලෙස පොලිස් දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව දළදා දැක්මේ රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද පොලිස් නිලධාරීන්ගේ ඒ ඒ පොලිස් ස්ථාන වෙත ලැබී තිබූ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු D කවර අදාළ පොලිස් ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ගෙන්වා ගෙන විශේෂ ආරක්ෂක හා ප්‍රවාහන සැලැස්මක් යටතේ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2025.04.20 දින රැගෙන යෑමට කටයුතු කරන ලදී. එම පොලිස් නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම 2025.04.24,25, 28 හා 29 දිනවල දී මහනුවර උසස් බාලිකා විදුහල් පරිශ්‍රයේ පිහිටුවන ලද විශේෂ මධ්‍යස්ථානයේ දී සිදු කරන ලදී. දළදා දැක්මේ විශේෂ රාජකාරී සඳහා අනුයුක්ත කරන ලද ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ නමින් තමාගේ නිත්‍ය හමුදා කඳවුරට ලැබී තිබූ D කවර අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත දැනුම් දී ආරක්ෂිතව මහනුවරට රැගෙන විත් මහනුවර එම නිලධාරීන් අනුයුක්ත කරන ලද කඳවුරේ දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට අවශ්‍ය පහසුකම් සපයන ලදි.

## 4. ආබාධ සහිත ඡන්දහිමියන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අන්තර්කරණය කිරීම සඳහා පහසුකම් සැලසීම

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ක්‍රියාවලිය තුළ ආබාධ සහිත ඡන්දහිමියන්ට අපහසුතාවයකින් තොරව ඡන්දය සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් (Reasonable Accommodations) සම්පාදනය සදහා මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරන ලදි. එහිදී, ඡන්ද විමසීමේ දී ඡන්ද පත්‍රිකාව වලංගු ලෙස සලකුණු කිරීමට නොහැකි අන්දමේ පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක් හෝ ශාරීරික අශක්නුතාවකට පත් ඡන්දහිමියෙකුට එම ඡන්දහිමියා විසින් නියම කරනු ලබන පරිදි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ කාර්යය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී සහායකයකු ලවා ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට යම් තැනැත්තකු කැටුව යා හැකි ය. ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවන ස්ථානයේ සිට ඡන්ද විමසීම පවත්වන ශාලාව වෙත මීටර් 100 හෝ ඊට වැඩි දුරක් පයින් ගමන් කිරීමට සිදුවන අවස්ථාවල දී යම්කිසි කායික ආබාධයක්/ඇවිදීමේ අපහසුතාවයක් නිසා පයින් යාම් ඊම් කළ නොහැකි තැනැත්තෙකුට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි භූමියේ ප්‍රධාන පිවිසුම් දොරටුවේ සිට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල දක්වා ත්‍රිරෝද රථ මගින් නොමිලේ ප්‍රවාහන පහසුකම් සලසන ලදි.

පූර්ණ හෝ අර්ධ දෘශ්‍යාබාධ සහිත ඡන්දහිමියන්ට තනිවම ඡන්දය සලකුණු කිරීම සඳහා "ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට මඟපෙන්වන ස්පර්ශක රාමුව (Tactile Stencil Frame)" සෑම ඡන්ද මධ්‍යස්ථානයක ම භාවිත කිරීමට පහසුකම් සලසන ලදි. ස්පර්ශක රාමුව භාවිතා කරමින් ඡන්දය සලකුණු කරන දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට කිසිදු බාධාවකින් තොරව ඡන්දය සලකුණු කිරීමට අවශ්‍ය පහසුකම් සහ සහාය ලබාදීමට ක්‍රියා කරන ලෙස ඡන්ද පොළ කාර්යය මණ්ඩලය දැනුම්වත් කරන ලදි. එමෙන්ම මැතිවරණ කොමිෂන් සභාව විසින් පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත, ඡන්දය පාවිච්චි කිරීමේ දී අනන්‍යතාවය සනාථ කිරීමේ දී වලංගු අනන්‍යතා ලේඛනයක් (වලංගු හැඳුනුම්පතක්) ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති බැවින් එය ඡන්ද පොළේ දී ඉදිරිපත් කරන ඡන්ද දායකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවකාශය ලබාදුනි. තවද, ශ්‍රවණාබාධ සහිත ඡන්දදායකයින්ගේ දැනගැනීමේ පහසුව සඳහා ඡන්ද පොළ පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් (වලංගු අනන්‍යතා ලේඛන සහ ඡන්ද පොළ පරිශ්‍රයේ තහනම් දෑ) සංඥා භාෂාවෙන් රූපසටහන් සහිතව සකස් කර සෑම ඡන්ද පොළක ම ප්‍රදර්ශනය කරන ලදි.



ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට මඟපෙන්වන ස්පර්ශක රාමුව

## 5. නිල ඡන්ද දැන්වීම්පත්

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම සම්බන්ධ කටයුතු 2025.04.16 දින තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. එසේම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාදීමේ විශේෂ දින ලෙස 2025.04.20 හා 2025.04.27යන දිනවල දී බෙදාහැරීම් කටයුතු සිදු කළ අතර නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අවසන් බෙදීම 2025.04.29 දින සිදු කරන ලදි. 2025.04.29 දිනෙන් පසුව නිල ඡන්ද දැන්වීම් පත් නොලද ඡන්ද හිමියන්ට 2025 මැයි මස 06 දින දක්වා කාර්යාල වේලාව තුළ දී 2024 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛනයේ දැක්වෙන පරිදි තමන්ගේ ලියාපදිංචි ලිපිනයට අදාළ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව නිල ඡන්ද දැන්වීම්පත ලබා ගැනීමට අවස්ථාව ලබාදුනි.




## 6. ඔබේ අපේක්ෂකයා දැන ගන්න Know Your Candidate (KYC)


මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වී සිටි බැවින් ඡන්ද දායකයාට නියමිත පළාත් පාලන ආයතනයේ අපේක්ෂක ලැයිස්තුව පහසුවෙන් ලබා ගැනීමේ ක්‍රමවේදයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙන ලදි. මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වෙත පිවිස (https://eservices.elections.gov.lk යොමුව හරහා) මැතිවරණ ඉ සේවා යටතේ එහි "පුරවැසියන් සඳහා" වන යොමුවෙන් "මැතිවරණය සඳහා ජන්ද හිමි ලියාපදිංචි තොරතුරු ඉ සේවාව " වෙත පිවිස තම හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ පසු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 ට අදාළ ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු දැක්වෙන අතර එහි පහළ ඇති "KYC" යොමුවමගින් ඡන්ද හිමියාට අදාළ පළාත් පාලන ආයතනය වෙනුවෙන් තරග වදින අපේක්ෂකයන්ගේ තොරතුරු ඉතා පහසුවෙන් දැන ගැනීමේ අවස්ථාව මෙවර ඡන්ද දායකයන්ට හිමිවිය.

## 7. වලංගු හැඳුනුම්පත්

2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත, ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායකයා විසින් ලබාගැනීමට පෙර ඡන්ද පොළේ දී ඉදිරිපත් කිරීමේ නීතිමය අවශ්‍යතාව දක්වා ඇත. එයට අමතරව වලංගු විදේශ ගමන් බලපත්‍රය, වලංගු රියැදුරු බලපත්‍රය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ වැඩිහිටි හැඳුනුම්පත, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද පූජ්‍ය/ පූජක හැඳුනුම්පත, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන "ජාතික හැඳුනුම්පතේ තහවුරු කිරීමේ ලිපිය", ආබාධිත තැනැත්තන් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත, මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත හා මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ඡායාරූප සහිත තාවකාලික රියැදුරු බලපත්‍රය ද මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්දදායකයින්ට



ත්‍රිවිධාකාර මාධ්‍ය පිළිබඳව සළකා බැලීමේදී ඒ ඒ මාධ්‍ය පළකරන ලද සමස්ත මැතිවරණ දැන්වීම් ප්‍රමාණය




සමස්ත මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ඉහත ආකාර තුනෙහිම මාධ්‍ය ප්‍රචාරය සඳහා වැඩිම පිරිවැයක් දරන ලද පළමු අපේක්ෂකයන් 20 දෙනා පිළිවෙළින් වැය කරන ලද මුදල

| දරන ලද පිරිවැය (රුපියල්) | | දරන ලද පිරිවැය (රුපියල්) | |
|---|---|---|---|
| 1 | 109,424,093.31 | 11 | 20,704,552.83 |
| 2 | 101,986,083.70 | 12 | 20,236,248.80 |
| 3 | 93,428,330.40 | 13 | 19,937,914.76 |
| 4 | 81,778,253.18 | 14 | 18,224,317.00 |
| 5 | 34,104,320.00 | 15 | 17,031,726.00 |
| 6 | 29,403,677.40 | 16 | 15,333,165.48 |
| 7 | 26,684,649.40 | 17 | 14,850,928.99 |
| 8 | 24,484,104.50 | 18 | 14,324,037.50 |
| 9 | 22,502,238.60 | 19 | 13,370,382.00 |
| 10 | 22,028,913.70 | 20 | 12,942,248.00 |

අපේක්ෂක දායකත්වය සහිත මැතිවරණ දැන්වීම් ප්‍රචාරයේදී ඒ ඒ දේශපාලන පක්ෂ තම අරමුදල් වැය කර ඇති ආකාරය (පළමු දේශපාලන පක්ෂ 10)

| දරන ලද පිරිවැය (රුපියල්) | | දරන ලද පිරිවැය (රුපියල්) | |
|---|---|---|---|
| 1 | 521,622,882.87 | 6 | 44,490,445.10 |
| 2 | 433,627,909.40 | 7 | 15,353,980.48 |
| 3 | 413,700,633.81 | 8 | 12,553,235.00 |
| 4 | 271,098,683.89 | 9 | 7,232,937.00 |
| 5 | 181,283,204.96 | 10 | 4,848,607.53 |

අපේක්ෂක දායකත්වය රහිත මැතිවරණ දැන්වීම් ප්‍රචාරයේදී ඒ ඒ දේශපාලන පක්ෂ තම අරමුදල් වැය කර ඇති ආකාරය (පළමු දේශපාලන පක්ෂ 10)

| දරන ලද පිරිවැය (රුපියල්) | | දරන ලද පිරිවැය (රුපියල්) | |
|---|---|---|---|
| 1 | 243,426,702.55 | 6 | 1,601,246.53 |
| 2 | 433,627,909.40 | 7 | 619,429.20 |
| 3 | 176,694,063.35 | 8 | 492,060.00 |
| 4 | 12,553,235.00 | 9 | 355,770.00 |
| 5 | 2,496,582.00 | 10 | 347,312.00 |

## සාරාංශය

මෙම පිරිවැය සමීක්ෂණය පිළිබඳව වගකීම දරනු ලබන්නේ IRES ආයතනයයි. අදාළ පාර්ශ්ව නිසිපරිදි දැනුම්වත් කිරීම, අදාළ මාධ්‍ය ආයතන මගින් මිල ගණන් විස්තර ලබාගැනීම (Rate Cards) සහ මිල තීරණය කිරීමේ දී බදු ප්‍රතිශත ගණනය කිරීම ආදිය මෙහිදී IRES ආයතනයේ පර්යේෂණ කණ්ඩායම නිසි පරිදි සිදුකොට ඇත. එනමුත් එය මාධ්‍ය ආයතනය හා මැතිවරණ ප්‍රචාරක දැන්වීම ලබාදෙන පාර්ශ්ව අතර සිදුව ඇති ගනුදෙනුවේ නියම ස්වරූපය එළිදැක්වීමක් යැයි නොසිතිය යුතු ය. ඊට හේතු රාශියකි. පළමුවැන්න නම් Rate Cards යනු මාධ්‍ය ආයතන අදාළ දැන්වීමක මිල තීරණය කිරීම සඳහා යොදා ගන්නා එකම නිර්ණායකය නොවීමයි. තවද මැතිවරණ දැන්වීම් ද ඇතුළත් සමස්ත දැන්වීම් කර්මාන්තයේ සුවිශාල පදාසයක් සඳහා උරදෙනු ලබන්නේ එකී ක්‍රියාවලියේ මධ්‍යයේ සිටින වෙළෙඳ ප්‍රචාරක ආයතනයන්ය. ඒ අනුව අවසන් මිල තීරණය කිරීමේ දී ඔවුන්ද තවත් එක් තීරක පාර්ශ්වයකි. එබැවින් මෙමඟින් ලබාගත හැකි ආලෝකය වන්නේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ දිශානතිය අවබෝධ කරගැනීමයි. ඊට අමතර වශයෙන් එවැනි ව්‍යාපාරයක නිරායාසයෙන් පවත්නා අභිරුචින්, පක්ෂපාතිත්වයන් මෙන්ම යම්යම් රටාවන් හඳුනා ගැනීම සඳහා ද මෙවැනි පිරිවැය සමීක්ෂණයකින් ලද හැකි සහය අනල්පය.

ඉහත දත්ත මනා සැලකිල්ලෙන් පරිශීලනයේදී වැටහෙන තවත් කරුණක් නම් මුදල් යහමින් වැය කලද මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයකදී ජයග්‍රහණයක් අත්පත් කරගැනීම සමහරවිට එතරම් පහසු නොවන බවයි. සමහර විට සමහර අපේක්ෂකයන් සම්ප්‍රදායික මාධ්‍ය වෙනුවට නව මාධ්‍ය (සමාජ මාධ්‍ය වේදිකා) මෙන්ම ක්ෂේත්‍රයේ එනම් බිම් මට්ටමේ ප්‍රචාරය සඳහා වැඩි ඉඩක් ලබාදී ක්‍රියා කිරීමටද ඉඩ ඇත. එහෙත් ඉහත ඉහළම පිරිවැයක් දැරූ අපේක්ෂකයන් 20 ක් අතරින් පාර්ලිමේන්තුගත වීමට තරම් ශක්තියක් ලබා ඇත්තේ අපේක්ෂකයන් 05 දෙනෙක් පමණි. මෙවැනි ප්‍රචාරක උපක්‍රමයක් ශ්‍රී ලංකාවේ ජන්දදායකයන් නිරීක්ෂණය කරන්නේ පළමුවරටය. එබැවි මෙහි දැක්වෙන සංඛ්‍යා දත්ත මඟින්ද මනාව පිළිඹිබු වේ. එහි එකදු තනි අපේක්ෂකයෙක් වැඩි පිරිවැයක් කිසිදු විටෙක මාධ්‍ය ප්‍රචාරය සඳහා දරා නොමැති බව මෙම පර්යේෂණය තහවුරු කරයි. එමෙන්ම ප්‍රචාරන කටයුතු සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළ ද ජයග්‍රහණය සඳහා එකී වියදම් කිරීම කිසිසේත්ම බලපා නොමැති බව ද නිරීක්ෂණය වේ. එමෙන්ම ප්‍රචාරණය සඳහා කරන ලද මෙම අතිවිශාල මුදල් ප්‍රමාණය තුළින් අදාළ ආයතන රාජ්‍ය බදු ආදායමට එකතු වී තිබේද යන්නද වෙනමම විමර්ශනය කළ යුතුය. මෙම පර්යේෂණය මඟින් තහවුරු වන අනෙක් වැදගත් නිරීක්ෂණයක් වන්නේ එලෙස ඉහළම පිරිවැයක් දැරූ අපේක්ෂකයන් 20 දෙනා අතර එකම අපේක්ෂිකාවක් හෝ රැඳී නොසිටීමයි. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය පර්යාලෝකයකින් විග්‍රහ කිරීමට වුවද මෙම දත්ත සහ සංඛ්‍යා ප්‍රමාණවත් බව මේ අනුව පැහැදිලි වේ.

වේද, ඒවාද පොලීසිය වෙත යොමුකිරීම ඔවුන්ගේ වගකීමයි. මින් පැහැදිලි වන්නේ මෙවැනි නීතියක අවශ්‍යයෙන්ම පැවතිය යුතු නියාමන අධිකාරියේ පුළුල් ක්‍රියාකාරිත්වය අසීමාන්තිකව කප්පාදු කොට ඇති බවයි.

මැතිවරණ ප්‍රචාරක වියදම් සුපරීක්ෂණය (Campaign Cost Monitoring) යන ක්‍රියාවලියේ වැදගත්කම මතුවන්නේ මෙවැනි පසුබිමක් තුළ දීය. නියාමන අධිකාරියක් සතුව අදාළ ආදායම් වියදම් වාර්තා පුළුල් සුපරීක්ෂාවකට ලක්කිරීමේ බලතල නැතිවීම හා මැතිවරණ ප්‍රචාරක කාල සමයේ අපේක්ෂක චර්යාව නිරීක්ෂණයට අවැසි නිදහස් වරම අහිමිවීම තුළ මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබෙන වාර්තා සතුව ඇත්තේ කවර ආකාරයේ විශ්වසනීයත්වයක් ද යන්න මෙහිදී සාකච්ඡාවට ලක්වීම අහම්බයක් නොවේ. මීට දිය හැකි පිළිතුරු සම්පාදනය විය යුත්තේ ද මෙරටේ පාර්ලිමේන්තුව මගිනි. එහෙත් ඉන් පරිබාහිරව අත්හදා බැලිය හැකි සාර්ථක විකල්ප අතරින් එකක් වන්නේ සිවිල් සමාජ මැදිහත්වීමක් ඔස්සේ සිදුකල හැකි සුපරීක්ෂණයකි. මෙම සටහන මෙතැන් සිට වෙන් වන්නේ එවැනි මැදිහත්වීමක හැඩය, වර්ණය සහ ප්‍රතිඵල විමසුම කෙරෙහිය.

ඉහත කී දුර්වලත්වය පොදුවේ මෙවැනි ප්‍රගතිශීලි නීති අඩපන කිරීමට වුවද හේතුවිය හැකි අතර යමෙක් අවසානයේ දී එය ප්‍රජාතන්ත්‍රවාදයේ පවත්නා අඩුවක් හෙවත් ඌනතාවක් ලෙසද (Democratic Deficit) හඳුනාගත හැකිය. ඒ අනුව ඊට විකල්පයක් ලෙස යෝජිත කාර්යයක් වූයේ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන පහක් සහ එක් පර්යේෂණ කණ්ඩායමක් එක්ව නිර්මාණය කරගන්නා ලද 'ඡන්ද සල්ලි මීටරේ' නම් මාර්ගගත නිරීක්ෂණ ක්‍රමවේදයයි (Campaign Expenditure Observation Online Tool) එහිදී එක් එක් සංවිධාන වෙත මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා අවස්ථාව උදා විය. ඒ සඳහා උපස්තම්භක නිර්ණායකය වූයේ එකී සංවිධානවල පරිචය සහ අරමුදල් සම්පාදනයේ හැකියාවයි. ඒ අනුව ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ සහ මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES) පවරා ගත් කාර්යය වූයේ ප්‍රචාරක ව්‍යාපාරය තුළ සම්ප්‍රදායික මාධ්‍ය කවරාකාරයෙන් එහි තරගකරුවන් ප්‍රවර්ධනය කරන්නේද යන්න නිරීක්ෂණයයි. 'අපේ ඡන්ද සල්ලි මීටරේ' සමස්ත නිරීක්ෂණ කාර්යය සඳහා දායක වූ සංවිධාන ජාලය සමන්විත වූයේ වූයේ පැෆ්රල් (PAFFREL), මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV), කැෆේ (CaFFE), ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (TISL), ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ සහ මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES)සහ හෑෂ්ටැග් ජෙනරේෂන් (Hashtag) යන සංවිධාන වලිනි.

## ක්‍රමවේදය

මෙම පිරිවැය නිරීක්ෂණයේ (Cost Monitoring) මූලික අරමුණ වූයේ මෙරටේ සම්ප්‍රදායික මාධ්‍ය මුදල් ලබාගනිමින් සිදුකරන ප්‍රවර්ධනාත්මක මාධ්‍ය මැදිහත්වීමේ ප්‍රධාන ගතිකයන් හඳුනා ගැනීමයි. ඒ අනුව ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන ජාතික මට්ටමේ මැතිවරණ දෙක සඳහාම එකම ආකාරයේ ක්‍රමෝපායක් අනුගමනය කිරීම සිදුවිය. එහෙත් ඉඩකඩ මඳකම නිසා මෙම සටහන තුලින් ඉස්මතු කරනු ලබන්නේ පාර්ලිමේන්තු මැතිවරණයේ පිරිවැය නිරීක්ෂණ කාර්යය පිළිබඳව පමණි. සමස්තයක් ලෙස පිරිවැය නිරීක්ෂණය තුළ අවධානයට ලක්කරන ලද්දේ මෙරටේ ප්‍රධාන ධාරාවේ යම් ස්ථාවරත්වයක් ලබා ජනගතව තිබූ තෙයාකාරයක මාධ්‍යයන්ය. සංඛ්‍යාත්මකව ඒ මෙලෙසය.




මෙම පිරිවැය නිරීක්ෂණයේ කාල සීමාව වූයේ සමස්ත මැතිවරණ ප්‍රචාරක කාල සීමාවයි. පුවත්පත් පමණක් ඡන්ද දැන්වීම (Poll Notice) ප්‍රකාශයට පත්කළ දින පටන් නිරීක්ෂණයට ලක් කරන ලදී. එහෙත් ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා නිරීක්ෂණයට ලක්කරන ලද්දේ මැතිවරණ කොමිෂන් සභාව අදාළ නාම යෝජනා ලබාගත් දින සිටය.

අදාළ නිරීක්ෂණය ඇරඹීමට පෙරම නිරීක්ෂණයට පාදක කරගන්නා සියලු මාධ්‍ය ආයතන වෙත ඒ පිළිබඳව ලිඛිතව දන්වා යවන ලදී. ඊට සමාන්තරව ගාස්තු අයකිරීමේ මිලගණන් සඳහන් සවිස්තරාත්මක විස්තරයක් (Rate Cards) අදාළ ආයතන මඟින් ලබාගැනීම ද එහිදී සිදුවිය. නිරීක්ෂණයේ අවසාන තීරණ සඳහා එළඹීමේ දී ඒ ඒ ආයතන ගාස්තු අයකිරීමේ දී ලබාදී ඇති සහන මෙන්ම බදු මුදල් ගණනය වැනි කරුණු කෙරෙහි ද සැළකිය යුතු මට්ටමේ අවධානයකින් ක්‍රියා කිරීමද සිදුවිය. දවස පුරා එනම් 24X7 ආකාරයේ සජීවී ක්‍රියාකාරිත්වයක් ආයතනය තුළ පවත්වා ගැනීම ද විශේෂත්වයකි. ඒ සඳහා තිස් දෙදෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් තත් විෂයේ විශේෂ පුහුණුවක් ලත් පර්යේෂකයෙකු යටතේ සේවයේ යෙදුනු අතර ගණනය සඳහා පාදක කරගත් රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සහ ගුවන්විදුලි දැන්වීම් පටිගත කොට තැබීම, මෙන්ම පුවත්පත් දැන්වීම් ගොනු කිරීමද පිරිවැය නිරීක්ෂණයේ ප්‍රමුඛ පියවරක් සේ සළකන ලදි.

## සමස්ත පිරිවැය නිරීක්ෂණයේ කැපී පෙනෙන අවස්ථා

දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන් මැතිවරණ ප්‍රචාරක කාල සමයේ මාධ්‍ය උදෙසා වැය කරන ලද සමස්ත වියදම රු.1,924,128,272.33 කි.

වැඩිම මැතිවරණ ප්‍රවර්ධන දැන්වීම් ප්‍රමාණයක් පළකළ දේශපාලන පක්ෂය විසින් දරන ලද වියදම රු.243,426,702.55 කි.

අපේක්ෂකයෙකුට සහය පළකරමින් වැඩිම ප්‍රචාරක මාධ්‍ය දැන්වීම් ප්‍රමාණයක් සඳහා දරන ලද වියදම රු.109,424,093.31 කි. සමස්තයක් ලෙස මැතිවරණ දැන්වීම් සඳහා වැඩිම ආදායමක් උපයා ගන්නා ලද රූපවාහිනී නාලිකාව ඉපයූ අදායම රු.607,220,218.60 කි.


සමස්තයක් ලෙස මැතිවරණ දැන්වීම් සඳහා වැඩිම ආදායමක් උපයා ගන්නා ලද පුවත්පත විසින් ඉපයූ අදායම රු.33,482,811.02 කි.

සමස්තයක් ලෙස මැතිවරණ දැන්වීම් සඳහා වැඩිම ආදායමක් උපයා ගන්නා ලද ගුවන්විදුලි නාලිකාව ඉපයූ අදායම රු.13,806,714.00 කි.



තම අනන්‍යතාව තහවුරු කිරීම සදහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී තිබුණි.

## 8. විධාන, මාධ්‍ය උපමාන හා ආචාර ධර්ම


ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2023 ජනවාරි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2023 ජනවාරි මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.
මිල : රු. 25.00 තැපැල් ගාස්තුව : රු. 50.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සියලුම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්, සියලුම මාධ්‍ය ආයතන සඳහා මැතිවරණ සමය තුළදී අනුගමනය කළ යුතු විධාන, මාධ්‍ය උපමාන හා ආචාර ධර්ම පිළිබදව රැස්වීම් කැදවා දැනුම්වත් කර ඇති අතර ඒ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2426/06, 2426/07, 2426/08 හා 2025 මාර්තු මස 03 වන දින අති විශෙෂ ගැසට් නිවේදන 3ක් නිකුත් කර තිබේ.

## 9. නීති බලාත්මක කිරීම

මැතිවරණයක් පැවැත්වෙන කාලසීමාවකදී ඒ සම්බන්ධව පවතින නීති කඩකිරීම් හා පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් පිහිටුවනු ලබන මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන රට පුරා ක්‍රියාත්මක වෙනු ලැබේ. මෙම සියලුම මැතිවරණ පැමිණිලි විමර්ශන ඒකකවලට දුරකථන, ෆැක්ස්, ඉ තැපෑල, වට්ස්ඇප් මගින් මැතිවරණ පැමිණිලි ඉදිරිපත් කළ හැකි වන පරිදි පහසුකම් සලසා තිබු අතර, ඒ පිළිබඳව පොදු මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ද පියවර ගෙන තිබුණි.

මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ) (4)(අ)අනුවඡන්ද විමසීම් කාල සීමාවේදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් නිශ්චල හෝ චංචල දේපළක් අපේක්ෂකයකු, දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක ප්‍රවර්ධනයට හෝ වළකාලීමට භාවිතා කිරීමට එම ඡන්දයේ දී අපේක්ෂකයකු,දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් භාවිත කිරීම කොමිෂන් සභාවේ සභාපතිගේ හෝ ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින් තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හිමිවේ. තවද රජයට සහ රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාලසීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන් සේවකයින් බඳවාගැනීම, උසස් කිරීම හා මාරු කිරීම සීමා කිරීම සම්බන්දව ක්‍රියාකළයුතු ආකාරය ඇතුළත් කර 2025.03.03 දිනැති LAE/2025/06 චක්‍රලේඛයද මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබේ.

එමෙන්ම මැතිවරණ කොමිෂන් සභාව නව තාක්ෂණය මැතිවරණ ක්‍රියාවලිය තුළට ඇතුළත් කරගත් තවත් අනර්ඝ අවස්ථාවක් ලෙස මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ පැමිණිළි ලබාදීම සඳහා නවතම ජංගම දුරකථන යෙදවුමක් හදුන්වා දීම දැක්විය හැක. ඒ අනුව, විධිමත් සහ නව තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ මැතිවරණ පැමිණිලි ඉදිරිපත් කිරීමට අදාළව EC EDR නම් ජංගම දුරකථන යෙදවුම තුළින් හැකියාව හිමි වන අතර එහිදී පැමිණිල්ල යොමු කරන පුද්ගලයාට සිය පැමිණිල්ල සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් ගත් ක්‍රියාමාර්ගය පිළිබඳ විස්තර ද මේ තුළින්ම දැන ගැනීමේ අවස්ථාව උදාවේ. එමෙන්ම මෙම යෙදවුම හරහා වීඩියෝ, ඡායාරූප තොරතුරු ලබාදීමේ හැකියාවද පවතී.

## 10. මැතිවරණ වියදම් නියාමනය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම, පළාත් සභා ඡන්ද විමසීම, පාර්ලිමේන්තු මැතිවරණය සහ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම යනාදිය පැවැත්වෙන අවස්ථාවක, ඒවා සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා ඒවා නියෝජනය කරනු ලබන අපේක්ෂකයින් විසින් මැතිවරණ කටයුතු වෙනුවෙන් දරනු ලබන වියදම් නියාමනය කිරීම පිණිස, සහ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධව නීතිමය විධිවිධාන සැලැස්වීම සඳහා, 2023 ජනවාරි මස 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පනවනු ලැබිණි.

අදාළ ඡන්ද විමසීම පිළිබඳ නාමයෝජනා භාරදීමේ කාලසීමාව අවසන් වී දින 5ක කාලයක් ඇතුළත ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විමසා, ලංකාවේ පවත්නා උද්ධමන අනුපාතය හා ජාතික පාරිභෝගික මිල දර්ශකය සැලකිල්ලට ගෙන, නියම කරනු ලබන මුදලකින්, ඡන්ද විමසීම් බල ප්‍රදේශයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව ගුණකර "අවසර ලත් මුදල" මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි. ඒ අනුව මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ පළාත් පාලන ආයතන 339 සඳහා එක් ඡන්දහිමියෙක් වෙනුවෙන් අවසරලත් මුදල වශයෙන් රු. 74.00 සිට රු. 160.00 දක්වා වූ පරාසයක මුදලක් ගණනය කිරීම්වලට අනුව හදුන්වාදෙන ලදි. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 සඳහා තරග කරනු ලබන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ගණනය කරන ලද උපරිම වියදම් සීමාවන් 2025.03.23 දිනැති අංක 2428/72 හා 2025.03.28 දිනැති අංක 2429/47 දරන ගැසට් පත්‍රවල පළ කරන ලදි.

## 11. ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කිරීම

මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සදහා දිස්ත්‍රික්ක 25 තුළ ඡන්ද මධ්‍යස්ථාන 13759ක ඡන්ද විමසීම් කටයුතු පැවැත්වීමට අවශ්‍ය සියලු සංවිධාන කටයුතු ඊට පෙර දින තේරීම්භාර නිලධාරීන් විසින් අවසන් කරන ලදී. මෙහිදී කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථානවල දී ම ඡන්ද විමසීම හා ගණන් කිරීම සිදු වූ අතර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල දී අදාළ කොට්ඨාසය තුළ තෝරාගත් එක් ස්ථානයක දී ඡන්ද ගණන් කිරීම සිදු කරන ලදි. ඡන්ද පොළවල් භාරව ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු ඇතුළු සෙසු කාර්ය මණ්ඩලය ද ඡන්ද

පොළවල්වලට අවශ්‍ය බඩු බාහිරාදිය ද ඡන්ද විමසීම් දිනට පෙර දින, ඡන්ද පොළවල් කරා ප්‍රවාහනය කරන ලදී. නිකුත් කිරීම්, භාර ගැනීම්, ඡන්ද පොළවල් සඳහා රජය සතු ගොඩනැගිලි, පාසල් හා ආගමික ස්ථාන සතු ගොඩනැගිලි භාවිතා කරන ලදී. ඡන්දදායකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සදහා පෙර මැතිවරණවල දී මෙන්ම පෙ.ව.07.00 සිට ප.ව. 04.00 දක්වා කාලය ලබාදුන් අතර ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන 5,783ක දී මැතිවරණයට තරග කළ පාර්ශ්වයන්ගේ නියෝජිතයන් ඉදිරියේ ඡන්ද ගණන් කිරීම සිදුකරන ලදී.

එහිදී එක් එක් පළාත් පාලන ආයතන මට්ටමින් තැපැල් ඡන්ද ප්‍රතිඵල හා සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සිදු කොට ප්‍රතිඵල සකස් කිරීමේ මධ්‍යස්ථානවල දී ප්‍රතිඵල අතින් සකස් කිරීම හා පරිගණක පද්ධතියක් ආශ්‍රයෙන් සකස් කිරීම ද සිදුකොට ප්‍රධාන කාර්යාලය වෙත ෆැක්ස් හා ඉ- සේවාවක් හරහා ප්‍රතිඵල ලේඛන ගෙන්වා ගන්නා ලදී. ප්‍රධාන කාර්යාලයේ දී එම ප්‍රතිඵල ලේඛන වගුගත කිරීම හා පරිගණක වැඩසටහන ආශ්‍රයෙන් සකස් කොට පරික්ෂා කිරීමෙන් අනතුරුව සභාපතිතුමාගේ අත්සනින් නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවීම හා මාධ්‍ය ආයතන වෙත යැවීම සිදු කරන ලදී.

## එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව, ගෘහ සංඛ්‍යාව, ඡන්ද මධ්‍යස්ථාන, ගණන් කිරීමේ මධ්‍යස්ථාන හා කොට්ඨාස සංඛ්‍යාව

| අනු අංකය | පරිපාලන දිස්ත්‍රික්කය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | ගෘහ සංඛ්‍යාව | ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව | ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව | කොට්ඨාස සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 1,773,460 | 578,503 | 1,209 | 1,209 | 303 |
| 2 | ගම්පහ | 1,896,304 | 650,102 | 1,252 | 403 | 403 |
| 3 | කළුතර | 1,033,206 | 370,041 | 728 | 268 | 268 |
| 4 | මහනුවර | 1,202,558 | 434,036 | 914 | 368 | 368 |
| 5 | මාතලේ | 434,246 | 175,921 | 342 | 162 | 162 |
| 6 | නුවරඑළිය | 610,117 | 217,932 | 538 | 168 | 168 |
| 7 | ගාල්ල | 856,355 | 314,350 | 758 | 253 | 253 |
| 8 | මාතර | 693,549 | 254,582 | 542 | 222 | 222 |
| 9 | හම්බන්තොට | 526,599 | 207,035 | 442 | 153 | 153 |
| 10 | යාපනය | 498,140 | 187,959 | 517 | 243 | 243 |
| 11 | කිළිනොච්චිය | 102,387 | 38,379 | 108 | 40 | 40 |
| 12 | මන්නාරම | 91,373 | 34,990 | 114 | 47 | 47 |
| 13 | වවුනියාව | 129,293 | 51,976 | 154 | 56 | 56 |
| 14 | මුලතිව් | 87,800 | 36,512 | 137 | 41 | 41 |
| 15 | මඩකලපුව | 455,520 | 194,708 | 448 | 144 | 144 |
| 16 | අම්පාර | 478,669 | 201,233 | 458 | 202 | 202 |
| 17 | ත්‍රිකුණාමලය | 319,399 | 142,138 | 321 | 129 | 129 |
| 18 | කුරුණෑගල | 1,430,286 | 561,790 | 1,092 | 373 | 373 |
| 19 | පුත්තලම | 668,525 | 261,279 | 484 | 182 | 182 |
| 20 | අනුරාධපුරය | 750,101 | 311,766 | 680 | 225 | 225 |
| 21 | පොළොන්නරුව | 354,111 | 135,937 | 299 | 98 | 98 |
| 22 | බදුල්ල | 712,401 | 291,642 | 567 | 217 | 217 |
| 23 | මොණරාගල | 403,519 | 170,075 | 383 | 117 | 117 |
| 24 | රත්නපුරය | 932,855 | 360,750 | 689 | 249 | 249 |
| 25 | කෑගල්ල | 715,565 | 256,368 | 583 | 214 | 214 |
| **එකතුව** | | **17,156,338** | **6,440,004** | **13,759** | **5,783** | **4,877** |






# මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳ පර්යේෂණාත්මක සටහනක්

**මංජුල ගජනායක**
පර්යේෂක/ විධායක අධ්‍යක්ෂ, IRES ආයතනය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මෑත කාලීනව මැතිවරණ බිමෙහි සිදු වූ ප්‍රශස්ත හා වඩාත් සංවාදශීලී වෙනස්කම් රැසක් සනිටුහන් කළ කාල සීමාව කුමක් වනු ඇති දැයි ඔබ යම් දිනෙක සිහි කොට තිබේද? ඔබ සතුව බොහෝ අදහස් තිබිය හැකිය. එහෙත් අපගේ අදහස වන්නේ ඒ 80 දශකයේ මුල් භාගය බවයි. එතෙක් පැවති මැතිවරණ ක්‍රමය දැඩි වෙනසකට ලක්කිරීමෙන් අනතුරුව මැතිවරණ ක්‍රියාවලියේ කළමනාකරණය උදෙසා අවශ්‍යයෙන්ම වැළඳ ගත යුතුව පැවති නව ප්‍රවේශ සමූහයක් එකවිට විවර වූයේ මෙ සමයේදීය.

එහි කැපී පෙනෙන ක්ෂේත්‍රය වූයේ නව නීති හඳුන්වා දීම සහ නීති සංශෝධනයි. එහෙත් අදවන විට මැතිවරණ ක්‍රියාවලියේ දිස්වන ආකර්ශනීය එළඹුම් සඳහා ප්‍රතිචාර දැක්වීමට අසූව දශකයේ හදුන්වා දී ඇති නීති ප්‍රමාණවත් නොවන බව පහසුවෙන් වැටහෙන කරුණකි. "Strong rules make fair races'" යනුවෙන් වන පතළ කියුමක් ඇත්තේය. එය මැතිවරණ සඳහා ද වලංගුය. එබැවින් සාධාරණ තරගයක් නිර්මාණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව යම් යම් සාධනීය ප්‍රවේශ තම පරිපාටිගත හා මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා අන්තර්ග්‍රහණය කරගෙන තිබීම එතරම් පුදුම විය යුතු කරුණක් නොවේ. මැතිවරණ වෙත ආශක්ත සිවිල් සමාජ සංවිධාන ද ඒ කෙරෙහි තියුණු බලපෑමක් එල්ල කරමින් සිටි බවද සැවොම දන්නා කරුණකි. ඒ අනුව ඊට අදාළ නව ප්‍රතිචාරාත්මක හැඩගැසීම් කිහිපයක් මැතිවරණ කොමිෂන් සභාව දෙසින් දිස් විය. එහිලා අනුදත් එක් ප්‍රවේශයක් වූයේ වසර 1978 වර්ෂයේ හඳුන්වා දුන් නව මැතිවරණ ක්‍රමය දක්වාම මෙරටේ පැළපදියම්ව පැවති එහෙත් අසූව දශකයේ නව නීති ප්‍රතිසංස්කරණ අභ්‍යාසයේ දී ගිලිහී ගිය මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනය සඳහා වන යාන්ත්‍රණයයි.

ඒ අනුව මෙම කෙටි සටහන මඟින් උත්සහ කරනු ලබන්නේ මෙලෙස හඳුන්වා දුන් නව මැතිවරණ ප්‍රචාරක නීතිය වූ 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනතට අනුවඉන් අපේක්ෂිත අරමුණු සාධනය කරගැනීම සඳහා සුදුසු වේදිකාවක් නිර්මාණය කර තිබේද යන්න විමසා බැලීමයි. එහිදී උපයුක්ත විග්‍රහය සඳහා පාදක වන්නේ එකී ක්‍රමවේදය නිරීක්ෂණය සඳහා ම හඳුන්වා දුන් මැතිවරණ ප්‍රචාරක වියදම් සුපරීක්ෂණය කිරීමේ වැඩසටහනෙහි දත්ත, සංඛ්‍යා සහ සමහර නිර්දේශ මෙන්ම යෝජනාවේ.

මෙරටේ නවවන විධායක ජනාධිපතිවරයා තෝරාගැනීම සඳහා පැවති ජනාධිපතිවරණය (2024 සැප්තැම්බර් 21) මෙන්ම දහවන පාර්ලිමේන්තුවේ සාමාජිකයන් තෝරාගැනීම සඳහා පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණය ද (2024 නොවැම්බර් 14) කරුණු කිහිපයක් හේතුවෙන් අතිශය තීරණාත්මක විය. ඉන් ප්‍රමුඛ කරුණක් වූයේ මැතිවරණ ඉතිහාසයේ සැලකිය යුතු කාල සීමාවකට පසු නැවතත් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන්හි එක් චෛන්ද්‍රීය අංගයක් වන එහි අරමුදල් නියාමනය කිරීම පිළිබඳව වෙසෙස් අවධානයකින් යුත් ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමයි. හැත්තෑව දශකයට ඔබ්බෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක සමයේ මෙම නීතිය අදාළ වූයේ මැතිවරණ සඳහා තරග වදින අපේක්ෂකයන් වෙත පමණක්ය. එහෙත් අදවන විට මැතිවරණ දෙපාර්තමේන්තුව, කොමිෂන් සභාවක් ලෙසට පරිවර්තනය වී ඇති අතර මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත අධිකරණයේ අභියෝගයට ලක්කිරීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණය නියම කරන ලද්දේ එහි ප්‍රතිපාදන දේශපාලන පක්ෂ වෙතද අදාළ කළ යුතුය යන්නයි. ඒ අනුව වත්මන් ප්‍රචාරක වියදම් නීතිය අපේක්ෂකයන් සහ දේශපාලන පක්ෂ යන දෙපාර්ශ්වය වෙතම අදාළ වීම, එදා සහ මෙදා යන කාල අන්තර දෙකෙහි දක්නට ඇති සුවිශේෂී වෙනස්කම ලෙස දැක්විය හැකිය.

### සංකල්පීය ප්‍රවේශය

අනෙක් වැඩි අවධානයක් ලක් කළ යුතු සංකල්පීය ප්‍රවේශයක් පිළිබඳව ද කරුණු දැක්විය යුතු ය. එනම් ශ්‍රී ලංකාවේ දැනට සම්මතව ඇත්තේ මැතිවරණ ප්‍රචාරක වියදම් කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති පනතක්ය යන්නයි. ශ්‍රී ලංකාව ඇතුළත්ව බොහෝ රටවල දේශපාලන විචාරකයන් මෙන්ම පර්යේෂකයන් සහ ක්‍රියාකාරීන් ඉමහත් රුචිකත්වයක් දක්වන්නේ දේශපාලන මූල්‍යය නියාමනය කෙරෙහිය. එනිසාම ඔවුන් අතින් නිරතුරුව සිදුවන අත්වැරැද්දක් ද ඇත්තේය. එනම් දේශපාලන මූල්‍ය ඇසින් බලා සිදුකරන නිරීක්ෂණ සීමිත මැතිවරණ ප්‍රචාරක යාන්ත්‍රණ වෙත පතිත කිරීමයි. එය ශ්‍රී ලංකාවේ ද යහමින් සිදුවෙමින් පවතී. එබැවින් දේශපාලන මූල්‍යය (Political Finance) සහ ප්‍රචාරක වියදම් නියාමනය (Campaign Expenditure Regulations) අතර ඇති න්‍යායාත්මක සහ ප්‍රායෝගික වෙනස මෙන්ම එහි ශ්‍රී ලාංකේය භාවිතාව පිළිබඳව විචාරයට පෙර අවබෝධයක් ලබාගැනීම පූර්ව කොන්දේසියක් බවට පත්කර ගත යුතුව ඇත.

මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනයේ තවත් එක් සුවිශේෂී පැතිකඩක් වන්නේ අදාළ නීතිය මඟින් ප්‍රතිෂ්ඨාපිත නියාමන අධිකාරිය (බොහෝ දුරට මැතිවරණ කළමනාකරණ ආයතනය (EMB) කෙතරම් දුරට එකී විෂය පථයේ සමස්ත මෙහෙයවීම තම නිල වරම වෙත ග්‍රහණය කරගෙන තිබේද යන්නයි. එහි ශ්‍රී ලාංකේය අත්දැකීම පිළිබඳව සොයා බැලීමේදී පැහැදිලි වන්නේ මෙරටේ නියාමන අධිකාරිය මැතිවරණ කොමිෂන් සභාව වුවද අදාළ ආදායම් වියදම් වාර්තා ලබාගැනීම සහ නියමිත දිනට නොලැබුණු වාර්තා පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත කරුණු වාර්තා කිරීම ඔවුන් වෙත නීතියෙන් පැවරී ඇති ප්‍රධාන වගකීම බවයි. ඊට අමතර වශයෙන් යම් බාහිර පාර්ශ්වයක් මගින් අපේක්ෂක /පක්ෂ /ස්වාධීන කණ්ඩායම්වල ප්‍රචාරක කාල සමයේ අරමුදල් භාවිතය පිළිබඳව සිදු කළ පැමිණිලි